සබරගමුව පළාත් සභාව - Sabaragamuwa Provincial Council

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

Ministry of Education, Information Technology & Cultural Affairs

Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

අමාත්‍යාංශ ලේකම් / Secretary – Office – 045 2223015

කාර්යාලය / Office – නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042


මගේ අංකය / எனது இல / My Number – ME/E/1 (සබර/චක්‍රලේඛ)

ඔබේ අංකය / உமது இல / Your Number –

දිනය / திகதி / Date – 2023.05.07

---

සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,

**පළාත් අධ්‍යාපන චක්‍රලේඛ**
**සබර/2023/03**

**ඩෙංගු මදුරු ව්‍යාප්තිය පාලනය කිරීම**

මේ වන විට ඩෙංගු මදුරු ව්‍යාප්තිය වැඩිවීම හේතුවෙන් ඩෙංගු රෝගීන් විශාල සංඛ්‍යාවක් වාර්තා වී ඇත. එමෙන්ම ඩෙංගු රෝගය හේතුවෙන් ජීවිත හානිද සිදු වෙමින් පවතින තත්ත්වයකට පත්වී ඇත. සිසුයෙන් පාසල් දරුවන්ද මෙම රෝගයට ගොදුරු වන බව වාර්තා වී ඇත.

02. එමෙන්ම, මේ වන විට ඩෙංගු මදුරුවාගේ ජීවන චක්‍රයද වෙනස්වී මුළු දවස පුරාම මදුරුවා සක්‍රියව සිටින බවත්, අපිරිසිදු ජලයේ පවා මෙම මදුරුවා බෝවන බවත් සෞඛ්‍ය විශේෂඥයින් විසින් සොයා ගෙන ඇති බව වාර්තා වේ. එබැවින්, දැනට වසංගත තත්ත්වයත් බවට පත් වෙමින් පවතින මෙම ඩෙංගු මදුරු ගහනය පාලනය කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙලක් විදුහල්පතිවරු විසින් ආරම්භ කල යුතුය. ඒ සඳහා පහත උපදෙස් අනුව කටයුතු කරන ලෙස __කඩිනමින් සියළුම විදුහල්පතිවරුන් දැනුවත් කරන ලෙස මින් දන්වා සිටිමි.__

1. සතියේ එක් දිනයක එක් කාල පරිච්ඡේදයක් ඩෙංගු මර්දනය සඳහා ශ්‍රමදානයක් පාසලේ සිසුන්, දෙමව්පියන් හා ගුරුවරුන් සම්බන්ධ කර ගනිමින් ක්‍රියාත්මක කිරීම.
2. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල, නගර සභා, ප්‍රාදේශීය සභා යන ආයතන වල උපදෙස් හා අවශ්‍ය සහයෝගයන් ලබා ගැනීම.
3. මෙම රෝගය හා වසංගත තත්ත්වය පිළිබඳව පාසල් ළමුන් දැනුවත් කිරීම නිරන්තරයෙන් සිදු කිරීම.
4. පාසලේ සියළු පරිශ්‍රයන් නිරන්තරයෙන් පිරිසිදු කිරීම. ( කාර්යාල හා ඒ අවට පරිසරය, විද්‍යාගාර, කාණු පද්ධති, වැසිපිළි, මල් බඳුන් පෙල්ලම් මිදුල්, ජල ටැංකි හා භාවිතයට නොගන්නා වැසිකිළි හා අඩක් නිම කල ගොඩනැගිලි පරිශ්‍රයන් ආදිය )
5. මෙම කරුණු පිළිබඳව දෙමව්පියන් දැනුවත් කිරීම, තම නිවස හා පරිශ්‍රය අවට මදුරුවන් බෝ වෙන ස්ථාන විනාශ කර පිරිසිදුව පවත්වා ගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබාදීම.
6. පාසලේ මෙම කාර්යයන් සඳහා සෞඛ්‍ය විෂයභාර ගුරුවරයකු / නියෝජ්‍ය විදුහල්පතිවරයකු පත්කිරීම හා ඒ පිළිබඳව නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම.
7. මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය ආයතන, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කලාප අධ්‍යාපන කාර්යාල හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාල මගින් ලබාදෙන උපදෙස් අනුව කටයුතු කිරීම.

සුජානි ආර්. විජේතුංග
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය රත්නපුර

o/c

සුජානි ආර්.විජේතුංග.
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව.

පිටපත්

| | | |
|---|---|---|
| 01. | ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව | - කා.දැ.පි. |
| 02. | ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය, ස.ප.ස. | - කා.දැ.පි. |
| 03. | සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | - .දැ.පි. හා අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා |
| 04 | සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | - දැ.පි. හා අ.කා.ස. |
| 05. | පළාත් පාලන කොමසාරිස් | - දැ.පි. හා අ.කා.ස. |
| 06. | නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ රත්නපුර/කෑගල්ල | - දැ.පි. හා අ.කා.ස. |
| 07. | නාගරික කොමසාරිස් | - දැ.පි. හා අ.කා.ස. |
| 08. | කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු | - දැ.පි. හා අ.කා.ස. |